ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය -2020
-----------------------------------------------------

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක එස්ආර්අයි -2217 දරන ණය ගිවිසුමේ 6 උපලේඛනයේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය,වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. මාර්ග අංශයේ ආයතන වැඩිදියුණු කිරීම සහ නියමු කාර්යසාධනය පදනම් කරගත් නඩත්තු කොන්ත්‍රාත් සංවර්ධනය කිරීම තුළින් ජාතික මහාමාර්ග ජාලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා මාර්ග අංශයේ ආයතන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 21,655 කට සමාන එ.ජ.ඩො. මිලියන 208ක් වූ අතර ඉන් රු. මිලියන 15,275කට සමාන එ.ජ.ඩො මිලියන 150 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. 2008 පෙබරවාරි 15වන දින ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර ඒ අනුව මුල් ණය මුදල ඇතුළත ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීම සඳහා 2008 මැයි 27 දින ණය ගිවිසුම සංශෝධනය කර ඇත. ඉහත ණය මුදලට අමතරව, අංක 1355පී දරන තවත් ණය ගිවිසුමක් ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල සමඟ 2010 ඔක්තෝබර් 04 දින අත්සන් කර තිබුණු අතර රු. මිලියන 880කට සමාන එ.ජ.ඩො මිලියන 8ක් වෙන් කිරීමට ඔපෙක් අරමුදල විසින් එකඟවී තිබුණි. මුල් ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.කෙසේවෙතත්, මහාමාර්ග ලේකම් ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම නිසා ව්‍යාපෘතියේ කාලය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ආර්ථික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලේ මූල්‍යන ක්‍රියාකාරකම් 2015 ජූනි 30 දින අවසන් කරන ලදි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය එහි කටයුතු 2020 දෙසැම්බර් 31 වන විටත් අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි.

## 1.3 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවයන් සතු වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිවො හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම,ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. භෞතික කාර්ය සාධනය

## 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ලැබී තිබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව නිම කිරීමට සැලසුම් කළ ජාතික මාර්ග 09 කිලෝමීටර් 279කින්, ව්‍යාපෘතිය මගින් ජාතික මාර්ග 05ක කිලෝමීටර් 255ක් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ කටයුතු නිමකර 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වෙත භාරදී තිබුණි.

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතිය මගින් රු. මිලියන 2,938ක පිරිවැයකට මහාමාර්ග ලේකම් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමකර 2016 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘතිය වෙත ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකය නිකුත් කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය සමග අනුකූලතා සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. | මහාමාර්ග ලේකම් ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකය ලබා ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

## 2.3 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණන නිර්දේශ |
|---|---|---|
| ලැබී තිබුණු තොතුරු අනුව, ඉඩම් කොටස් 4,431 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර, ඉන් 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 4,431ක් සඳහා වන්දි මුදල් රු.මිලියන 2,267ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය 1986 අංක 13 දරන ඉඩම් අත්පත් කර ගැනීම සහ නිරවුල් කිරීමේ පනතේ 44 වගන්තිය යටතේ 2020 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ඉඩම් කොටසක අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | 44 වගන්තිය යටතේ නිකුත් කිරීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත. | වත්කම්වල හිමිකාරීත්වය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |